# සාර්ථක ගොවිතැනකට වගා ළිං

ඩී.ජී. කරුණාරත්න
සංඛ්‍යාන නිලධාරී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**ශ්‍රී ලාංකික ජනතාවගෙන් වැඩිදෙනා තම ජීවිකාව කරගෙන යන්නේ ගොවිතැනින් ලැබෙන ආදායමෙනි. නමුත් ගොවීන්ගෙන් වැඩිදෙනෙක් ඉතා අඩු ආදායම් ලබන නිසා අමාරුවෙන් ජීවත් වෙති. මෙම තත්ත්වයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ කන්න දෙක හොඳින් වගා කරගැනීමට තරම් ජල පහසුකම් නොමැතිවීමයි. මේ අතර බොහෝ ගොවීන්ට වසරකට එක් කන්නයක් හෝ වසර කිහිපයකට එක් කන්නයක් හෝ වගා කර එයින් දිවිපෙවෙත ගෙනයාමට සිදුව ඇත. මේ තත්ත්වය වාරි පහසුකම් ඇති අයට ද බලපා ඇති අතර අහස්දියෙන් වගා කටයුතු කරන අයට දරුණු ලෙසින් බලපා ඇත.**

ජල ප්‍රශ්ණය යම් පමණකට හෝ විසඳ ගැනීමට සාර්ථක ක්‍රමයක් ලෙස දැනට හඳුන්වා දී ඇති වගා ළිං සැලකිය හැකිය. දැනට වියළි කලාපයේ සැලකිය යුතු ප්‍රමාණයක් ගොවීන් වගා ළිං යටතේ වගාවේ නියැලී සිටී. මෙම ගොවීන් දෙස බැලූ විට පෙනී යන්නේ තමා අවට සිටින අනෙක් බොහෝ ගොවීන් නියං රකුසාගෙන් බැටකද්දී මොවුන් ඉතා සාර්ථකව තම ගොවිතැන් කටයුතු කරමින් හොඳ ආදායම් ලබාගන්නා බවයි. අහස්දියෙන් වගා කරන ගොවීන්ට තම ආර්ථිකය වැඩිදියුණු කරගැනීමට ඇති හොඳම විකල්පය ලෙස වගා ළිං හැඳින්විය හැකිය. විශේෂයෙන් සුළු වාරිමාර්ග පද්ධති යටතේ ද බොහෝ විට මහා වාරිමාර්ග පද්ධති යටතේ ද වගාවේ නියැලී සිටින ගොවීන්ට යල් කන්නයේ බොහෝ විට ජල හිඟයකට මුහුණදීමට සිදුව ඇත. යල් කන්නයේ මිරිස්, එළවළු වැනි අතුරු බෝග කුඹුරුවල වගා කිරීම සඳහා ද ජලය සපයාගත හැකි හොඳම ක්‍රියා මාර්ගයකි වගා ළිං. මෑත කාලයේ සිට මහා වාරිමාර්ග පද්ධති යටතේ ද වගා කරන ගොවීන්ට කන්නය අවසානයේ ජල හිඟයකට මුහුණදීමට සිදුව ඇත. මේ සඳහා විකල්ප ජල සැපයුම් මාර්ගයක් ලෙස ද වගා ළිං භාවිතා කල හැකිය. දැනට එසේ කරන සමහර ගොවීහු සිටිති.

අප රටේ වියළි කලාපයේ ගොවියා පාරම්පරිකව තම ගොඩ ඉඩම්වල සහ හේන්වල මාස් කන්නයේ කුරක්කන්, අමු, මෙනේරි වැනි ධාන්‍ය වර්ගද, වට්ටක්කා වැනි එළවළු වර්ග ද වගා කරයි. යල් කන්නයේ ද තල වැනි බෝග වගා කළහ. නමුත් අහස්දියෙන් කළ එම වගා ඉතා අවදානම් විය. දැන් සිදුවන කාලගුණික විපර්යාසය තුළ ගොවීන්ට එවැනි ගොවිතැන් කිරීම ඉතාමු දුෂ්කර කාර්යයක් වී ඇති බව එම ගොවීන්ගේම අදහස්වලින් පැහැදිළි වෙයි.

වියළි කලාපයේ මෙම ගොවීහු දැන් වගා ළිං යටතේ මාස් කන්නයේ හා යල් කන්නයේ වඩා ආර්ථිකව ඵලදායී වන බෝග වගාවකට පෙළඹී සිටිත්. පෙර වගාකළ පාරම්පරික බෝග රටාව අතහැර වගා ළිං යටතේ යම්තාක් දුරට වෙනත් බෝග වගා කිරීමට පෙළඹීම ද ගොවීන් බෝග විවිධාංගීකරණයට පෙළඹීමකි. පාරම්පරික ගොවිතැන, අඩු ආදායම් ලැබූ සහ හුදෙක් පාරිභෝජනය අරමුණු කරගෙන කළ ගොවිතැන් වූ අතර අවදානම ද වැඩි එකක් විය. අද අවදානම අඩු ආර්ථිකමය වශයෙන් වඩා ඵලදායී වූ වෙළඳ පොළ ඉලක්ක කරගත් ගොවිතැන් රටාවකට පරිවර්තනය වී ඇත.

වියළි කලාපයේ ගොවීන් වගා ළිං යටතේ කරන වගාවන් සැලකීමේ දී හොඳින් පෙනී යන කරුණක් නම්, වැඩි ගොවීන් පිරිසක් මනා සැලසුමකින් තොර වගා ක්‍රම අනුගමනය කරන නිසා වගා ළිං වලින් නිසි ප්‍රයෝජන ලබා නොගන්නා බවයි. ගොවීන්ට හුරු පුරුදු කන්න වගා ක්‍රමය සහ හේන් වගාව කරන ක්‍රමයටම මෙම ළිං යටතේ වගා කරන බව පැහැදිලි කරුණකි. මේ නිසාම හිඟ ජල සම්පතින් නිසි ප්‍රයෝජන ලබා නොගනී. එසේ නම් මේ තත්වයෙන් මිදිය හැක්කේ කෙසේද ? මනා ලෙස සැලසුම් කළ ගොවිපලක් තුළ අවුරුද්ද පුරා ඵලදායී වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු කළයුතු එකම කාර්යයි. මේ සඳහා පහත සඳහන් දේ අනුගමනය කළ යුතුය.

* ඉඩමේ පිහිටීම සහ එහි පසට ගැලපෙන පරිදි භූමිය සංවර්ධනය කිරීම
* ජලය කාර්යක්ෂමව බෙදාහැරිය හැකි ක්‍රමයක් සකස් කිරීම
* ජලය අපතේ නොහැර කාර්යක්ෂමව භාවිතා කිරීම
* සැමවිටම පසේ සාරවත් බව ආරක්ෂා කිරීම
* ආර්ථිකමය වශයෙන් වඩා ඵලදායී වූ අවුරුද්ද පුරා විහිදුනු වගා රටාවන් අනුගමනය කිරීම.

වගා ළිං ආශ්‍රයෙන් වගා කරන ගොවීන්ගේ ආදායම් තත්වය දියුණු කිරීමට සහ වෙළඳපොළ ඉලක්ක කරගත් ගොවිතැනක් කිරීම සඳහා ගොවීන් පෙළඹවිය යුතුය. මෙය කළ හැක්කේ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන මට්ටමෙනි. ක්ෂෙත්‍ර මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතුවල අඩපණවීම මෙම ගොවීන්ට සැළකිය යුතු ලෙස බලපා ඇත. විවිධ බෝග වලට වැළදෙන රෝග පිළිබඳ සහ ඒවාට අවශ්‍ය කෘමිනාශක ආදිය ගැන හරි වැටහීමක් ගොවීන්ට නොමැතිකමින් වගා පාලු වී ඇති අවස්ථා ද ඇත. විවිධ බෝග සම්බන්ධයෙන් අත්දැකීම් ගොවීන්ට නොමැතිවීම මෙයට හේතුවයි. මේ තත්වය මඟහැරීමට යම් ස්ථිර ක්‍රියා මාර්ගයක් නොගතහොත් මෙයින් නිසි ප්‍රයෝජන ගොවීන්ට ලබාගත හැකි නොවනු ඇත. මේ නිසා මේ ගොවීන්ට හොඳ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයක් ලබාදිය යුතුය.

වියළි කලාපයේ දැනට තනා ඇති වගා ළිං වල සාමාන්‍ය ගැඹුර අඩි 20 - 25 දක්වා ද විෂ්කම්භය අඩි 17 - 25 දක්වා ද වේ. මීට වඩා ප්‍රමාණයෙන් කුඩා ඒවා ද විශාල ඒවා ද අතලොස්සක් දැකිය හැකිය. මෙවැනි ළිඳක් සෑදීම සඳහා රු:40,000 ක් පමණ මුදලක් වැය කිරීමට සිදු වෙයි. ළිඳෙන් වතුර පොම්ප කිරීම සඳහා බොහෝ ගොවීන් භූමිතෙල් වලින් ක්‍රියා කරන පොම්ප භාවිතා කරන අතර, විදුලිය උපයෝගී කරගත හැකි ගොවීහු විදුලි මෝටර් ද භාවිතා කරති. වියලි කලාපයේ වගා ළිං සළකා බැලීමේ දී සාර්ථක ලෙස එක් ළිඳකින් වගා කළ හැක්කේ අක්කර 1 - 1.5 දක්වා වූ බිම් ප්‍රමාණයකි.

නමුත් දැනට අක්කර 1 - 3 දක්වා ප්‍රමාණයක් වගා කරන අවස්ථා ද ඇත. රු: 40,000/= වැනි විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීමට සිදුවන නිසා හොඳින් සැලසුම් කර වගා කිරීමේ. අවශ්‍යතාවය මෙන්ම හිඟ සම්පතක් වූ ජලය අරපිරිස්සමින් භාවිතා කිරීම පිළිබඳව ගොවීන් දැනුවත් විය යුතුය. බොහෝ ගොවීන් මේ මුදල ණය පදනම මත ලබා ගනී. එබැවින් කෙසේ හෝ එම මුදල්වත් උපයාගත යුතු නිසා සැලසුම්ගත වගා ක්‍රමවලට ගොවීන් හුරුවිය යුතුය. සාමාන්‍යයෙන් මිරිස් වැනි බෝග වගා කළ නිසා කන්නයකට රුපියල් ලක්ෂයක් පමණ

8 පිටුවට ➪

## සාර්ථක ගොවිතැනකට ....

6 පිටුවෙන්

වූ විශාල මුදලක් උපයා ගත් ගොවීන් ද සිටිති. නමුත් සාමාන්‍යයෙන් වගා ළිඳක් යටතේ අක්කරයකින් රුः 20,000/= - 50,000 ක ප්‍රමාණයක් ලබාගැනීමේ හැකියාවක් තිබේ.

ජල ප්‍රශ්නයට මුහුණ දී සිටින සියළුම ගොවීනට වගා ළිං මගින් ජලය සැපයීම ප්‍රායෝගිකව කළ නොහැක්කකි. නමුත් අප මුලින් කී පරිදි එම ප්‍රශ්නයට දැනට තිබෙන විකල්පය මෙයයි. මෙය බැලූ බැල්මටම පරස්පර විරෝධීය. එහෙත් ජල ප්‍රශ්නයෙන් බැටකන ගොවීන්ට මෙවැනි සහනයක් හෝ ලබාදීම ප්‍රශ්නය සෑහෙන දුරට විසඳීමකි. එබැවින් වගා ළිං ව්‍යාපෘති මගින් ගොවීන් ගෙන් සැලකිය යුතු පිරිසකට සෙත සැලසිය හැකිය.

තවද වගා ළිං විශාල වශයෙන් පිහිටුවීම අනාගතයේ භූගත ජල මට්ටම පහත බැසීමට හේතුවක් වනු ඇතැයි නොයෙක් විද්වතුන්ගේ මතය වී ඇත. එහෙත් එය ස්ථිරව පැවසීමට තරම් සාධක ඔවුනට මෙතෙක් ලැබී නැත. කෙසේ වෙතත් ඒ සම්බන්ධයෙන් අප විශේෂ අවධානය යොමුකළ යුතුය. මෙවැනි අවාසනාවන්ත තත්වයකට මුහුණදීමට සිදු නොවුන හොත් වගා ළිං යටතේ වගාවේ නිරත ගොවීන්ගේ ආර්ථිකය වඩා සාර්ථක එකක් වනු නියතය.